3158

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2014
**Year End Evaluation**

| ශ්‍රේණිය / தரம் / Grade | 11 | විෂයය / பாடம் / Subject | විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / Paper | I | කාලය / காலம் / Time | පැය 01 |
|---|---|---|---|---|---|---|---|

සැලකිය යුතුයි:

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40කි.

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට අදාළ කවය තුළ (×) ලකුණ යොදන්න.

---

(01) ක්ෂීරපායින්ගේ පමණක් දැකිය හැකි ලක්ෂණයක් වන්නේ,

(1) බාහිර කන් තිබීම ය. (2) අවලතාපී වීම ය.
(3) අනාකූල හැඩයක් තිබීම ය. (4) හෘදයේ කුටීර 4ක් තිබීම ය.

(02) බැක්ටීරියාවක් හා වෛරසයක් මඟින් ආසාදනය වන රෝග පිළිවෙළින් දක්වා ඇති ප්‍රකාශය වන්නේ,

(1) සරම්ප හා ක්ෂය රෝගය. (2) ඒඩ්ස් හා ලාදුරු.
(3) පිටගැස්ම හා ඩෙංගු. (4) කුරුළු උණ හා සරම්ප.

(03) මධු ශාකය පිළිබඳ ප්‍රකාශ තුනක් පහත දැක්වේ.

(අ) කඳ සිලින්ඩරාකාර වීම
(ආ) කේතුවල බීජ හට ගැනීම
(ඇ) සංයුක්ත පත්‍ර දැරීම

ඉහත ප්‍රකාශ අතුරෙන් සත්‍ය වනුයේ,

(1) අ පමණි. (2) අ හා ආ පමණි. (3) අ සහ ඇ පමණි. (4) ආ සහ ඇ පමණි.

(04) මිනිස් සිරුරේ වැඩිම ඔක්සිජන් සාන්ද්‍රණය හා අඩුම ඔක්සිජන් සාන්ද්‍රණය ඇති රුධිර වාහිනී යුගලය පිළිවෙළින් දක්වා ඇති පිළිතුර වන්නේ,

(1) උත්තර මහා ශිරාව සහ යාකෘතික ධමනි ය.
(2) පුප්ඵුසීය ශිරාව හා වෘක්කීය ධමනි ය.
(3) පුප්ඵුසීය ශිරාව සහ වෘක්කීය ශිරාව.
(4) සංස්ථානික මහා ධමනිය සහ පුප්ඵුසීය ධමනි ය.

(05) පේශි පටකවල අඩංගු සෛල සම්බන්ධයෙන් ප්‍රකාශ තුනක් පහත දැක්වේ.

(අ) ශාඛනය වී නැත.
(ආ) හරස් විලේඛන ඇත.
(ඇ) ඒක න්‍යෂ්ටිකය.

ඉහත සඳහන් ප්‍රකාශ වලින් කංකාල පේශි සෛල සතු ලක්ෂණයක්/ලක්ෂණ වන්නේ.

(1) අ පමණි. (2) ආ පමණි. (3) අ හා ආ පමණි. (4) ආ හා ඇ පමණි.

(06) ඌනන විභාජනය සිදුවන අවස්ථාවක් වන්නේ,
(1) ජන්මාණු මාතෘ සෛල වලින් ජන්මාණු නිපදවීම.
(2) හූනාගේ කැඩුණු වලිගය පුනර්වර්ධනය වීම.
(3) තුවාල වූ ස්ථානයක පටක වර්ධනය වීම.
(4) යුක්තාණුවක් නව ජීවියෙකු බවට විකසනය වීම.

(07) පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න.
(අ) හරිතප්‍රද රහිතය.
(ආ) කයිටීන්වලින් සෛල බිත්ති සෑදී ඇත
(ඇ) ජීවී සෛල තුළදී පමණක් ප්‍රජනනය කරයි
ඉහත ප්‍රකාශ අතරින් දිලීර සතු ලක්ෂණ / ලක්ෂණය දක්වෙන ප්‍රකාශය වන්නේ,
(1) අ පමණි. (2) ඇ පමණි. (3) අ හා ආ පමණි. (4) අ හා ඇ පමණි.

(08) මධ්‍ය ස්නායු පද්ධතිය හා සම්බන්ධ ප්‍රකාශ හතරක් පහත දක්වා ඇත. ඉන් අසත්‍ය ප්‍රකාශය තෝරන්න.
(1) අනුමස්තිෂ්කය මඟින් පේශී චලන සමායෝජනය සිදු කරයි.
(2) සුෂුම්නා ශීර්ෂකයෙන් අනිච්ඡානුග ක්‍රියා පාලනය කරයි.
(3) මස්තිෂ්කය සංවේදන හඳුනා ගැනීමට උපකාරී වේ.
(4) සියලු ම ප්‍රතීක ක්‍රියා සුෂුම්නාව මඟින් පාලනය කරයි.

(09) කාමරයක ජනේලයක් අසල තැබූ ශාකයක් ආලෝකය දෙසට නැමී වර්ධනය වන ආකාරය පහත රූපයේ දක්වේ. ඉහත සංසිද්ධිය හා නොගැළපෙන පිළිතුර වන්නේ,



(1) ශාකය ආලෝකය දෙසට නැමී වැඩීම ධන ප්‍රභාවර්ති චලනයකි.
(2) ශාකයක ආලෝකය වැටුණු පෙදෙසට විරුද්ධ පැත්තේ කඳෙහි වර්ධන වේගය වැඩිය.
(3) කඳේ අග්‍රස්ථයේ නිපදවෙන ඔක්සින ඊට මඳක් පහළින් ක්‍රියාත්මක වේ.
(4) ශාක කඳෙහි ආලෝකය ලැබුණු පැත්තේ ඔක්සින සාන්ද්‍රණය වැඩිය.

(10) බිහිරි බව ඇති වීමට වඩාත් ම බලපාන සාධකය විය හැක්කේ,
(1) බාහිර කන තුවාල වීම ය. (2) කර්ණ පටහ පටලය සිදුරු වීම ය.
(3) කර්ණ පටහ පටලය ඝනවීම ය. (3) මැද කනේ අස්ථිකා ඝනවීම ය.

(11) මිනිස් සිරුරේ පවතින හෝමෝන කිහිපයක් හා ඒවායේ කෘත්‍යයන් පහත දී ඇත.

| හෝමෝනය | කෘත්‍යය |
|---|---|
| a. ග්ලූකගන් | ග්ලූකෝස් ග්ලයිකොජන් බවට පත් කිරීම |
| b. ප්‍රොජෙස්ටෙරෝන් | සංසේචනයෙන් පසු ඩිම්බ නිපදවීම වැළැක්වීම |
| c. ඇල්ඩොස්ටෙරෝන් | මුත්‍රා සමග පිට වී යන ලවණ ප්‍රමාණය පාලනය කිරීම |
| d. තයිරොක්සින් | පරිවෘත්තිය සීඝ්‍රතාව පාලනය කිරීම |

හෝමෝනය හා එහි කෘත්‍යය පිළිබඳ <u>සාවද්‍ය</u> පිළිතුර කුමක් ද?

(1) a ය (2) b ය (3) c ය (4) d ය

(12) එක්තරා ශාක සෙල වර්ගයක විස්තර පහත දැක්වේ.

- ඝන නොවූ ඒකාකාර බිත්ති සහිත සජීවී සෙල වේ. ආහාර සංචිත කරයි.

ඉහත විස්තරයට අනුකූල සෙල වර්ගය කුමක් ද?

(1) පෙනේර නළ සෙල. (2) දෘඪස්තර සෙල.

(3) මෘදුස්තර සෙල. (4) සහචර සෙල.

(13) අණුක දැලිසක් අඩංගුවන ද්‍රව්‍ය වන්නේ,

(1) අයිස් ය. (2) මිනිරන් ය.

(3) දියමන්ති ය. (4) පොටෑසියම් ක්ලෝරයිඩ් ය.

(14) ආවර්තිතා වගුවේ 2වන ආවර්තයේ අඩංගු මූල ද්‍රව්‍ය පහත වගුවේ සඳහන් වේ.

| මූල ද්‍රව්‍යය | Li | Be | B | C | N | O | F | Ne |
|---|---|---|---|---|---|---|---|---|
| පරමාණුක ක්‍රමාංකය | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 |

සංයුජතාව 1ක් වන මූලද්‍රව්‍ය යුගලය වන්නේ,

(1) Li හා O. (2) F හා N. (3) Li හා F. (4) Be හා O.

(15) රසායනික ප්‍රතික්‍රියාවක සීඝ්‍රතාව පරීක්ෂා කිරීම සඳහා සකස් කළ ඇටවුමක් රූප සටහනක් පහත දැක්වේ.

තනුක HCl අම්ලය හා Zn කැබලි



ඉහත සඳහන් ඇටවුමෙහි සිදුවන ප්‍රතික්‍රියාව සඳහා ගතවන කාලයත්, ප්‍රතික්‍රියාව සිදුවන ප්ලාස්කුවේ මුළු ස්කන්ධයත් විචලනය වන ආකාරය නිවැරදිව දක්වා ඇති ප්‍රස්තාරය වන්නේ,

(1)



(2)



(3)



(4)



(16) $0.5 mol dm^{-3}$ වන ග්ලූකෝස් ද්‍රාවණ $200 cm^3$ ක් සෑදීමට අවශ්‍ය ද්‍රාව්‍ය ස්කන්ධය වන්නේ (ග්ලූකෝස්වල මවුලික ස්කන්ධය $180 g mol^{-1}$ වේ)

(1) 18g (2) 72g (3) 36g (4) 90g

(17) පරමාණුක ක්‍රමාංකය 18ක් වන X නම් මූලද්‍රව්‍යය සම්බන්ධයෙන් ප්‍රකාශ හතරක් පහත සඳහන් වේ. එම ප්‍රකාශවලින් සාවද්‍ය වන්නේ,

(1) X මූලද්‍රව්‍යයේ පරමාණුවක ශක්ති මට්ටම් 3ක් ඇත.

(2) X මූලද්‍රව්‍යය ආවර්තිතා වගුවේ VIII වන කාණ්ඩයට අයත් ය.

(3) X මූලද්‍රව්‍යය ද්විපරමාණුක වායු ලෙස පවතී.

(4) X මූලද්‍රව්‍යයේ සංයුජතාව 0ක් වේ.

(18) සිමෙන්ති කර්මාන්තයේ දී භ්‍රමණ පෝරණුව තුළ සෑදෙන ක්ලින්කර්වල අඩංගු වන්නේ,

(1) කැල්සියම් කාබනේට් හා කැල්සියම් සිලිකේට් ය.

(2) කැල්සියම් සිලිකේට් හා කැල්සියම් ඇලුමිනේට් ය.

(3) කැල්සියම් කාබනේට් හා කැල්සියම් ඇලුමිනේට් ය.

(4) කැල්සියම් සල්ෆේට් හා කැල්සියම් කාබනේට් ය.

(19) ජලාශයක පතුලේ සිටින මාළුවෙකු පිටකළ වායු බුබුලක් ක්‍රමයෙන් ඉහළට එනවිට එම වායු බුබුලේ පරිමාව හා වායු බුබුල ගමන් කළ දුර අතර අඳින ලද නිවැරදි ප්‍රස්තාරය වන්නේ,




(20) කාබන් හෝ කාබන්මොනොක්සයිඩ් මඟින් ඔක්සිහරණය කර නිස්සාරණය කරගනු ලබන මූලද්‍රව්‍යය වන්නේ,

(1) සෝඩියම් (2) ලෙඩ් (3) කැල්සියම් (4) රසදිය

(21) පහත දක්වා ඇති ඇටවුම් අතරින් යකඩ ඇණ වටා නිල් වර්ණයක් දක්නට ලැබෙන්නේ, (සැ.යු. ඇටවුම් 4ටම පිරිසිදු යකඩ ඇණ පොටෑසියම් ෆෙරිසයනයිඩ් හා පිනෝප්තලීන් මාධ්‍යයක් යොදා ඇත.)




(1) A හා B වල ය. (2) B හා C වල ය. (3) C හා D වල ය. (4) A හා D වල ය.

(22) වායුගෝලීය සංයුතිය වෙනස්වීම නිසා සිදුවන අහිතකර තත්ත්ව කිහිපයක් පහත සඳහන් වේ.

a. සාගර ජලයේ උෂ්ණත්වය ඉහළ යාම. b. පෘථිවියේ ධ්‍රැවවල අයිස් දියවීම.

c. සමෙහි පිළිකා ඇතිවීම. d. ශාක වල ප්‍රභාසංස්ලේෂණය අඩාල වීම.

ඉහත සිදුවීම් අතරින් ඕසෝන් ස්තරයට හානිවීම නිසා සිදුවිය හැක්කේ,

1. a හා b (2) b හා c (3) c හා d (4) a හා d

225

(23) පහත දක්වා ඇති රූප සටහන් වල දක්වෙන්නේ කොපර් සල්ෆේට් ද්‍රාවණයකින් සමාන පරිමා අඩංගු පරීක්ෂා නළවල එක හා සමාන මැග්නිසියම්, රිදී, සින්ක් සහ ඇලුමිනියම් යන ලෝහ කැබලි දමා ඇති ආකාරයයි.




කොපර් සල්ෆේට් ද්‍රාවණ සම පරිමා

ඉහත පරීක්ෂා නළ තුළ රසායනික විපර්යාසයක් දකිය නොහැක්කේ,

(1) A වල ය. (2) B වල ය. (3) C වල ය. (4) D වල ය.

(24) පහත සඳහන් ද්‍රාවණවලින් වැඩිම pH අගය දක්වන ද්‍රාවණය වන්නේ,

(1) සබන් ද්‍රාවණය ය. (2) විනාකිරි ය. (3) සීනි ද්‍රාවණ ය. (4) ජලය ය.

(25) පහත සඳහන් තරංග අතරින් විද්‍යුත් චුම්බක තරංග විශේෂයක් නොවන්නේ,

(1) අති ධ්වනි තරංග ය. (2) ක්ෂුද්‍ර තරංග ය.
(3) අධෝරක්ත කිරණ ය. (4) දෘශ්‍ය ආලෝකය ය.

(26) ධ්වනියේ ලාක්ෂණික ගුණ සම්බන්ධයෙන් පහත ප්‍රකාශ සලකා බලන්න.

a. ස්වරයක තාරතාව සංඛ්‍යාතය මත රඳා පවතී. තාරතාවය වැඩිවන විට හඬ තියුණු ය.
b. තරංගයක් ඇතට යත් ම එහි විස්තාරය ක්‍රමයෙන් අඩු වේ. ඒ නිසා හඬේ සැර අඩු වේ.
c. විවිධ සංගීත භාණ්ඩ වලින් එකම ස්වරයක් වාදනය කළ විට ඇතිවන ධ්වනි ගුණය වෙනස් වන්නේ තරංග රටාව නිසා ය.

ඉහත ප්‍රකාශ අතරින් සත්‍ය වන්නේ,

(1) a, b හා c වේ. (2) a හා b පමණි. (3) a හා c පමණි. (4) b හා c පමණි.

(27) ආලෝකය හැසිරවීමේ ක්‍රියාකාරකම් වලදී සිසුන් භාවිත කළ උපකරණ දෙකක තොරතුරු පහත දක්වේ.

X - සමාන්තර ආලෝක කදම්බ වර්තනය කර අභිසරණය කරයි.
Y - සමාන්තර ආලෝක කදම්බ පරාවර්තනය කර අභිසරණය කරයි.

X හා Y විය හැක්කේ,

(1) X - අවතල කාචය Y - අවතල දර්පණය (2) X - උත්තල කාචය Y - අවතල දර්පණය
(3) X - උත්තල කාචය Y - උත්තල දර්පණය (4) X - අවතල කාචය Y - උත්තල දර්පණය

(28) මෝටර් රථයක් A ස්ථානයෙන් ගමන් අරඹා B ස්ථානයට පැමිණීමට අදාළ ප්‍රවේග කාල ප්‍රස්තාරය පහත දක්වේ.



- ඉහත ප්‍රස්තාරයට අනුව රථයේ මන්දනය හා මන්දනයෙන් සිදුකළ විස්තාපනය පිළිවෙළින්,

(1) 0.6 $ms^{-2}$ හා 4.5 m වේ. (2) 0.1 $ms^{-2}$ හා 9m වේ.
(3) 1$ms^{-2}$ හා 4.5m වේ. (4) 1.2 $ms^{-2}$ හා 15m වේ.

(29) උණුවතුර බෝතලයක (තර්මෝස් ප්ලාස්කුව) තාපය හානිවීම වළක්වා ගැනීමට යොදා ඇති උපක්‍රම දෙකක් පහත දැක්වේ.

a - ද්වි ස්තර වීදුරු බිත්ති අතර අවකාශයේ වාතය ඉවත් කර මුද්‍රා තැබීම

b - ද්වි ස්තර වීදුරු බඳුනේ ඇතුල් පෘෂ්ඨවල රිදී ආලේප කර තිබීම

ඉහත a හා b උපක්‍රම වලින් තාපය හානිවීම වළක්වා ගැනීමට ආධාරවන තාප සංක්‍රාමණ ක්‍රම පිළිවෙළින්

(1) a සන්නයනය b විකිරණය (2) a සන්නයනය හා සංවහනය b විකිරණය
(3) a විකිරණය හා සන්නයනය b සංවහනය (4) a විකිරණය හා සංවහනය b සන්නයනය

(30) ප්‍රතිරෝධය 75 □ වූ විදුලි පහනකට 225V විභව අන්තරයක් ලබා දුන් විට ඒ තුළින් ගලායන ධාරාව වන්නේ,

(1) $\frac{225}{75}$ A (2) 225 x 75 A (3) $\frac{75}{230}$ A (4) $\frac{225}{75 \times 75}$ A

(31) පහත සඳහන් ප්‍රකාශ අතුරින් අසත්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) වස්තුවක ත්වරණයක් ඇතිකළ හැක්කේ බාහිර අසංතුලිත බලයකට ය.

(2) වස්තුවක ඇතිවන ත්වරණය එයට යොදන බලයට ප්‍රතිලෝමව ද එහි ස්කන්ධයට අනුලෝමව ද සමානුපාතික ය.

(3) චලිතයට එරෙහි බලයට සමාන බලයක් යෙදීමෙන් වස්තුවක ප්‍රවේගය නියතව පවත්වා ගත හැකි ය.

(4) සංතුලිත බල ක්‍රියාකරන විට වස්තුවක් නිශ්චලව පැවතිය හැකි ය.

(32)

| ප්‍රදාන පරිපථයේ ධාරාව ගැලීම | ප්‍රතිදාන පරිපථයේ බල්බය දැල්වීම |
|---|---|
| 1 | 0 |
| 0 | 1 |

ඉහත රූපයෙන් දැක්වෙන්නේ එක්තරා තාර්කික ද්වාරයකට අදාළ සත්‍යතා වගුවයි. ධාරාව ගැලීම 1 හා බල්බය නිවීයාම 0 ලෙස ද සැලකූවිට මෙයට අදාළ තාර්කික ද්වාරය වන්නේ,

(1) OR (2) AND (3) NOT (4) OR හෝ AND

(33) A නම් උපාංග තුළින් ප්‍රත්‍යාවර්ත ධාරාවක් යැවූවිට ලැබෙන ධාරාව කැතෝඩ කිරණ දෝලනේක්ෂයකින් පරීක්ෂා කළවිට ලැබෙන තරංග ආකාරය X ප්‍රස්තාරයේ දැක්වේ. එම පරිපථයට සමාන්තරගතව B නම් උපකරණය සම්බන්ධ කොට පරීක්ෂා කළ විට ලැබෙන තරංග ආකාරය Y ප්‍රස්තාරයේ දැක්වේ.






A හා B උපාංග පිළිවෙළින් සඳහන් පිළිතුර වන්නේ,

(1) ට්‍රාන්සිස්ටරය හා ඩයෝඩය. (2) ප්‍රතිරෝධකය හා සෘජුකාරක සේතුව.

(3) පරිණාමකය හා ධාරිත්‍රකය. (4) සෘජුකාරක සේතුව හා ධාරිත්‍රකය.

(34) 


තනි අචල කප්පියක් ආධාරයෙන් 5 kg ස්කන්ධය ඇති වස්තුවක් එසවීමට 60N ක බලයක් යෙදනු ලබයි. මෙම සරල යන්ත්‍රයේ යාන්ත්‍ර වාසිය කොපමණ ද? ($g = 10ms^{-2}$)

(1) $\frac{60}{50}$ (2) $\frac{50}{60}$ (3) $\frac{60}{50} \times 100$ (4) $\frac{50}{60} \times 100$

(35) 1kg ස්කන්ධයක් ඇති බෙලි ගෙඩියක් $20ms^{-1}$ ක ප්‍රවේගයකින් පොළවට වැටේ. පොළොවට වැටෙන මොහොතේ බෙලි ගෙඩිය සතු චාලක ශක්තිය වන්නේ,

(1) 200 J (2) 100 J (3) 400 J (4) 50 J

(36) වායුගෝලීය පීඩනය මැනීම සඳහා සැකසූ රසදිය වායු පීඩන මානයක් පහත රූපයේ දැක්වේ.




වායුගෝලීය පීඩනය දැක්වෙන රසදිය කඳේ උස වන්නේ,

(1) ZX (2) ZY (3) AY (4) AX

The National e-learning Portal for The General Education

(37) හෝර්ටන් තැන්නේ වසන ගෝනුන් සහ වියළි කලාපයේ ගෝනුන් එකම විශේෂයකට අයත් වුවද, හෝර්ටන් තැන්නේ ගෝනුන්ගේ ලෝම වඩාත් ඝනව වැඩී ඇත. මෙයට හේතුව වීමට වඩාත් ම ඉඩ ඇත්තේ මින් කවරක් ද?

(1) හෝර්ටන් තැන්නේ ගෝනුන් සතුව විශේෂ ජානයක් පැවතීම ය.

(2) ගෝනුන් සතුව පවතින ජානයක් හෝර්ටන් තැන්නේ ගෝනුන් තුළ වැඩියෙන් ක්‍රියාත්මක විය.

(3) හෝර්ටන් තැන්නේ ගෝනුන්ට ලෝම වැඩෙන ආහාර වැඩිපුර ලැබීම ය.

(4) හෝර්ටන් තැන්නේ දේශගුණික තත්වයන් බල පෑම නිසා ය.

(38) ගල් අඟුරු තාප බලාගාරවල දහනයෙන් පිටවන සල්ෆර් ඩයොක්සයිඩ් වායුව වායුගෝලයට එක්වීම අවම කිරීමට යොදා ගැනෙන ක්‍රමය වන්නේ,

(1) හුනු පල්පයක් තුළින් යැවීම ය.

(2) මුහුදු ජලය මඟින් දියවීමට ලක් කිරීම ය.

(3) ඉතා ඉහළ චිමිනියකින් දුම නිකුත් කිරීම ය.

(4) ස්ථිති විද්‍යුතය මඟින් අවක්ෂේප කිරීම ය.

(39) බෝ නොවන රෝග වාර්තාවීම වර්තමානයේ ශීඝ්‍රයෙන් සිදුවන බව වෛද්‍යවරු පවසති. මේ සඳහා බලනොපාන සාධකය විය හැක්කේ,

(1) ක්ෂණික ආහාර භාවිතය සුලබ වීම ය.

(2) කය වෙහෙසා කල යුතු කාර්යයන් අඩු වීම ය.

(3) තන්තු බහුල ආහාර ගැනීම ය.

(4) පිෂ්ඨය අධික ආහාර ගැනීම ය.

(40) ශබ්ද දූෂණය මෑත කාලීනව ශීඝ්‍ර වශයෙන් වර්ධනය වෙමින් පවතින පාරිසරික ගැටලුවක් ලෙස හඳුන්වා දිය හැක. එහි අහිතකර ප්‍රතිඵලයක් ලෙස සැලකිය නොහැක්කේ,

(1) පුෂ්ප පරාගණයට බාධා ඇතිවීම.

(2) මානසික ආතතිය ඇති වීම.

(3) වාතයේ සංයුතිය වෙනස්වීම.

(4) සිරුරේ හෝමෝන ක්‍රියාකාරිත්වය වෙනස්වීම.

229